# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2177/18 - 2020 මැයි මස 29 වැනි සිකුරාදා - 2020.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකියුඊඑන්/ඒ1/2/44.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/13/2010/HA/241.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අටුළුගම් කෝරළයේ බටහිර සුළු කොට්ඨාසයේ, අංක 119 B, දෙහිඕවිට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඊරියගොල්ල ගමේ පිහිටි මූලික පිඹුරු අංක කෑ/3629 හා 2019.01.18 දිනැති පිඹුරේ කැබලි අංක 1 ට මායිම්.

01. කැබලි අංක 1

ඉඩමේ නම: චැරිට් ගාර්ඩන්ස් *හෙවත්* හෙට්ටියාවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 6ක් හා මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7699.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අප්‍රේල් මස 30 වැනි දින පෙ.ව. 11.00 ට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 අප්‍රේල් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරය, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,  
ප්‍රාදේශීය ලේකම්,  
දෙහිඕවිට.

2020 මාර්තු මස 11 වැනි දින,  
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 80



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

***ශුද්ධිපත්‍රය***

*මගේ යොමු අංකය* : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකියුටීඑන්/ඒ1/2/58.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2016/වීඊ/264.

2018 ජූලි මස 09 වැනි දින අංක 2079/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

9 වැනි වගන්තිය - හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව: වුඩ්එන්ඩ්වත්ත - 2020.04.30 දින පෙ.ව. 10.00.

වන්දි ඉල්ලුම්පත ඉදිරිපත් කළ යුතු දිනය : 2020.04.16

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2020 පෙබරවාරි මස 26 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 81

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

***ශුද්ධිපත්‍රය***

*මගේ යොමු අංකය* : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකියුටීඑන්/ඒ1/2/59.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2016/වීඊ/265.

2018 ජූලි මස 09 වැනි දින අංක 2079/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් රජයට අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

9 වැනි වගන්තිය - හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව: ග්ලාසල්වත්ත - 2020.04.30 දින ප.ව. 1.00.

වන්දි ඉල්ලුම්පත ඉදිරිපත් කළ යුතු දිනය : 2020.04.16

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2020 පෙබරවාරි මස 26 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 82

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.